# ටී.ඩී.සී. ගුණවර්ධන එ. ශ්‍රී ලංකා දුම්රිය සේවය

RTIC Appeal (**පුද්ගලික වශයෙන් විභාග කිරීම**)/ 1967 /2020 (2020.03.03 දින පැවති විධිමත් කොමිෂන් සභා රැස්වීමේ දී විභාග කිරීමෙන් අනතුරුව අනුමත කරන ලද නියෝගය).

2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 32(1) වගන්තිය ප්‍රකාරව කරන ලද නියෝගය සහ 2017 තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභා රීතීන්හි (ගාස්තු හා අභියාචනා කාර්යය පටිපාටිය), රීති අංක 28 යටතේ පවත්වාගෙන යනු ලබන කාර්යය පටිපාටිය.

**සභාපති:** මහින්ද ගම්මම්පිල
**කොමිෂන් සභා සමාජික:** ජ්‍යෙෂ්ඨ නීතීඥ කිෂාලි පින්ටෝ ජයවර්ධන
**කොමිෂන් සභා සමාජික:** ජ්‍යෙෂ්ඨ නීතීඥ එස්. ජී. පුංචිහේවා
**කොමිෂන් සභා සමාජික:** විනිසුරු රෝහිනී වල්ගම

**අධ්‍යක්ෂ ජනරාල් :** වසන්ත හපුආරච්චි

**අභියාචක** ටී.ඩී.සී. ගුණවර්ධන
**නොතිසි ලත් පාර්ශවය** නම් කළ නිලධාරී, **ශ්‍රී ලංකා දුම්රිය සේවය**

**පෙනීසිටීම**

අභියාචක - ටී.ඩී.සී. ගුණවර්ධන
පොදු අධිකාරිය ජේ.ඒ.ඩී.ආර්. පුෂ්පකුමාර, තොරතුරු නිලධාරී
ඩී.ඒ. නයනානන්ද, අධ්‍යක්ෂ (පරිපාලන)

| | |
|---|---|
| තොරතුරු ඉල්ලීම ගොනු කරන ලද දිනය | 2019.07.29 |
| තොරතුරු නිලධරයා තීරණය ලබා දුන් දිනය | 2019.07.30 |
| නම් කළ නිලධරයා වෙත අභියාචනය යොමු කළ දිනය | 2019.09.10 |
| නම් කළ නිලධරයා තීරණය ලබා දුන් දිනය | ප්‍රතිචාරයක් නැත |
| තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව වෙත අභියාචනය යොමුකළ දිනය | 2019.10.30 |

## අභියාචනයට පසුබිම් වූ කරුණු:

අභියාචක විසින් 2019.07.29 දිනැති තොරතුරු ඉල්ලීම මඟින් පහත දැක්වෙන තොරතුරු ඉල්ලා සිටින ලදී.

| අනු අංකය | ලිපිය ඉදිරිපත් කළ දිනය | ලිපියේ සාරාංශය | ඉදිරිපත් කළේ කාවද යන වග | ලියාපදිංචි ලිපි අංකය |
|---|---|---|---|---|
| 01 | 2018.11.07 | කිසිදු හේතුවක් නොමැතිව පොලදු පාලන ශාඛාවේ පරිපාලන නිලධාරිතුමිය විසින් ද්වේශ සහගත ලෙස බැණ වැඩිම සම්බන්ධයෙන් | දුම්රිය සාමාන්‍යාධි කාරිතුමා වෙත කාර්යාලයේදී | |
| 02 | 2019.02.15 | පරිපාලන නිලධාරිනිය (පොදු පාලන) ගෙන් සිදුවන අකටුයුතුකම් සහ අසාධාරනකම් සම්බන්ධයෙන් දැනුම් දී සහනයක් බලාපොරොත්තු වීම් | අතිරේක දුම්රිය සාමාන්‍යාධි කාරිතුමා | 1739 |
| 03 | 2019.06.14 | පරිපාලන නිලධාරිනිය (පොදු පාලන) ගෙන් සිදුවන අකටුයුතුකම් සහ අසාධාරනකම් සම්බන්ධයෙන් දැනුම් දී සහනයක් බලාපොරොත්තු වීම් | අතිරේක දුම්රිය සාමාන්‍යාධි කාරිතුමා | 3754 |
| 04 | 2019.07.01 | පරිපාලන නිලධාරිනිය (පොදු පාලන) ගෙන් සිදුවන අකටුයුතුකම් සහ අසාධාරනකම් ,බැන තර්ජනයක් කිරීම් සම්බන්ධව සිදු කරන ලද පැමිණිල්ලෙන් පසු විමසීම් අංශයෙන් ඉවත් කිරීමට උත්සහ දැරීම සම්බන්ධව දැනුම් දී සහනයක් බලාපොරොත්තු වීම් | අතිරේක දුම්රිය සාමාන්‍යාධි කාරිතුමා | 4912 |

තොරතුරු නිලධාරියා විසින් 2019.07.30 දිනැතිව ප්‍රතිචාර දක්වමින් සඳහන් කර සිටින ලද්දේ තොරතුරු ඉල්ලීම සම්බන්ධයෙන් ගනු ලබන ඉදිරි ක්‍රියාමාර්ග දින 14 ක් තුළ දන්වන බවයි. නමුත් පනතේ නියමිත කාල පරාසයන් තුළ කටයුතු කිරීමට තොරතුරු නිලධාරියා අපොහොසත්වීම මත අභියාචක විසින් 2020.09.10 දිනැතිව නම්කළ නිලධාරියාට අභියාචනයක් යොමුකරන ලදි. නම්කළ නිලධාරියාද පනතේ නියමිත කාල සීමාව තුළ කටයුතු කිරීමට අපොහොසත්වීම මත අභියාචක විසින් 2019.10.30 දිනැතිව කොමිෂන් සභාවට අභියාචනයක් යොමුකරන ලදි.

**අභියාචනය සලකා බලන අවස්ථාවේ දී උද්ගත වූ කාරණා:**

අභියාචනා විභාගය සඳහා දෙපාර්ශ්වයම පැමිණ ඇති බව කොමිෂන් සභාව විසින් නිරීක්ෂණය කර සිටී.

මෙහිදී පොදු අධිකාරිය විසින් කරුණු දක්වා සිටින ලද්දේ අභියාචක විසින් මූලික විමර්ශන වාර්තාවකට අදාළ තොරතුරු ඉල්ලා ඇති බවත් එම මූලික විමර්ශන වාර්තාව 2020.02.07 වන දින අවසන් කර ඇති බවයි. ඒ අනුව එම මූලික විමර්ශන වාර්තාව අත්සන් කිරීම සඳහා සූදානම්ව ඇති බව පොදු අධිකාරිය විසින් කරුණු දක්වන ලදි.

මෙහිදී කොමිෂන් සභාව විසින් පොදු අධිකාරිය වෙත අවධාරණය කර සිටියේ 2020.02.07 දිනැතිව අවසන් කරන ලද මූලික විමර්ශන වාර්තාව එමගින් දක්වනු ලබන ඉදිරි ක්‍රියාමාර්ග පිළිබඳව සළකා බලා අභියාචක වෙත නිකුත් කළ හැකි බවයි.

**නියෝගය:**

කොමිෂන් සභාව නිරීක්ෂණය කර සිටිනුයේ නම්කළ නිලධාරියා විසින් පනතේ නියමිත කාල සීමාව තුළ ප්‍රතිචාර දක්වීමට අපොහොසත් වී ඇති අතර පනතේ දක්වන නියමිත කාල පරාසයන් තුළ කටයුතු කිරීමට තොරතුරු නිලධාරියාට මෙන්ම නම්කළ නිලධාරියාටද තොරතුරු පනතේ 25(2) හා 31(3) වගන්ති ප්‍රකාරව ව්‍යවස්ථාපිත යුතුකමක් පවතින බවයි.

ඒ අනුව 2020.02.07 දිනැතිව අවසන් කරන ලද මූලික විමර්ශන වාර්තාව මත පදනම්ව ඉදිරියට විනය පරීක්ෂණය පවත්වන්නේ නම් එය කොමිෂන් සභාවට දන්වන මෙන්ද එලෙස විනය පරීක්ෂණයක් නොපැවැත්වෙන්නේ නම් එම මූලික විමර්ශන වාර්තාව අභියාචකට ලබාදිය යුතු බවටද පොදු අධිකාරියට මින් නියෝග කර සිටී. ඒ අනුව අභියාචකට අදාළ මූලික විමර්ශන වාර්තාව යොමුකළ බවට දක්වමින් කොමිෂන් සභාවට එහි ආවරණ පිටපතක්ද පොදු අධිකාරිය යොමු කළ යුතු බවටද කොමිෂන් සභාව විසින් නියෝග කර සිටී.

මෙම අභියාචනය පිළිබඳ වැඩිදුර කරුණු විභාග කිරීම සඳහා 2020.06.23 දින පෙ.ව. 11.00ට කල්තබනු ලැබේ.

---

RTIC Appeal (**ලේඛනගත කාර්යපටිපාටිය**)/ 1967 /2020 (2021.05.04 දින පැවති විධිමත් කොමිෂන් සභා රැස්වීමේ දී විභාග කිරීමෙන් අනතුරුව අනුමත කරන ලද නියෝගය).

2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 32(1) වගන්තිය ප්‍රකාරව කරන ලද නියෝගය සහ 2017 තොරතුරු දැනගැනීමේ

අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභා රීතීන්හි (ගාස්තු හා අභියාචනා කාර්යය පටිපාටිය), රීති අංක 28 යටතේ පවත්වාගෙන යනු ලබන කාර්යය පටිපාටිය.

**සභාපති:** මහින්ද ගම්මම්පිල
**කොමිෂන් සභා සමාජික:** ජ්‍යෙෂ්ඨ නීතීඥ කිෂාලි පින්ටෝ ජයවර්ධන
**කොමිෂන් සභා සමාජික:** ජ්‍යෙෂ්ඨ නීතීඥ එස්. ජී. පුංචිහේවා
**කොමිෂන් සභා සමාජික:** විනිසුරු රෝහිනී වල්ගම

**අධ්‍යක්ෂ ජනරාල් :** වසන්ත හපුආරච්චි

**අභියාචක** - ටී.ඩී.සී. ගුණවර්ධන
**නොතිසි ලත් පාර්ශවය** නම් කළ නිලධාරී, **ශ්‍රී ලංකා දුම්රිය සේවය**

**පෙනීසිටීම**
මෙය පාර්ශ්වයන්ගේ ලිඛිත කරුණු දැක්වීම් මත පදනම්ව විභාග විය.

**අභියාචනය සලකා බලන අවස්ථාවේ දී උද්ගත වූ කාරණා:**

රට තුල COVID-19 හේතුවෙන් හටගෙන ඇති සෞඛ්‍ය තත්වය හේතුවෙන්, පුද්ගල ආශ්‍රය අවම කිරීම සඳහා, දැනට කොමිෂන් සභා රීතින්හි, රීති අංක 20 (ගාස්තු හා අභියාචනා කාර්යපටිපාටිය, ගැසට් අංක 2004/66, 2017.02.03) යටතේ පුද්ගලික විභාග කිරීම් සඳහා දින නියම කොට ඇති අභියාචනා, රීති අංක 19 හි ලේඛනගත කාර්යය පටිපාටිය යටතේ සලකා බලනු ලැබේ. ඒ අනුව මෙම අභියාචනය ගොනුවේ ඇති ලේඛන මත පදනම්ව කොමිෂන් සභාව විසින් සලකා බැලීමෙන් අනතුරුව පහත නියෝගයන් නිකුත් කරන ලදී. ඉහත ක්‍රියාපටිපාටිය පසු කාලීනව වෙනස් වීමට ලක්විය හැකිය. මේ සම්බන්ධව තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව මගින් දෙපාර්ශවය ම දැනුවත් කරන ලදී.

මෙහිදී කොමිෂන් සභාව අභියාචක සම්බන්ධ කරගැනීමේදී ඇය සඳහන් කරන ලද්දේ අදාළ තොරතුරු තමන් වෙත තවමත් නොලැබුණු බවයි. කෙසේ නමුත් පොදු අධිකාරියෙන් මේ පිළිබඳව විමසීමේදී ඔවුන් සඳහන් කරන ලද්දේ කොමිෂන් සභාවේ උපදෙස් මත අදාළ තොරතුරු මේ වන විටත් අභියාචක වෙත ලබාදී ඇති බවයි.

**නියෝගය:**

ඒ අනුව පොදු අධිකාරිය විසින් ලබාදී ඇතැයි සඳහන් කරන ලබන අදාළ තොරතුරු නැවත වරක් ලියාපදිංචි තැපෑලෙන් අභියාචක වෙත ලබාදීමටත් එලෙස යොමුකරන ආවරණ ලිපියේ පිටපතක් කොමිෂන් සභාවේ දැනගැනීම උදෙසා පොදු අධිකාරිය කොමිෂන් සභාවට යොමුකළ යුතු බවත් මින් නියෝග කර සිටී.

එසේම, අදාළ තොරතුරු ලැබීමෙන් මාසයක කාලයක් තුළ එම තොරතුරු සම්බන්ධයෙන් සැහීමකට පත්වන්නේ ද යන්න අභියාචක විසින් කොමිෂන් සභාවට දන්වනු ලැබීමට යටත්ව මෙම අභියාචනය මින් අවසන් කරනු ලැබේ.

කොමිෂන් සභා රීතීන්හි, රීති අංක 27 (ගාස්තු හා අභියාචනා කාර්යය පටිපාටිය, ගැසට් අංක 2004/66, 2017.02.03) ප්‍රකාරව මෙම නියෝගය දෙපාර්ශවය වෙත සන්නිවේදනය කරනු ලැබේ.

...........................................................
මහින්ද ගම්මම්පිල - සභාපති

...........................................................
කිෂාලි පින්ටෝ-ජයවර්ධන - කොමිෂන් සභා සාමාජිකා

...........................................................
එස්. ජී. පුංචිහේවා - කොමිෂන් සභා සාමාජික

...........................................................
රෝහිනී වල්ගම - කොමිෂන් සභා සාමාජිකා